# නර්තනය - 8 ශ්‍රේණිය

## (පළමු වාරය )



## 4.2 පතුරු නැටුම හා සබැඳි කවි ගායනා

- පතුරු නැටුම අතීතයේ සිට විනෝදාස්වාදය අරමුණු කොට ගෙන නිර්මාණය වූ ගැමි නැටුමකි.
- පතුරු කවිවල අන්තර්ගතය විමසීමේ දී ගැමි සමාජයේ පැවති ඇදහිලි හා විශ්වාස, ගුරු භක්තිය සමඟිය, සාමූහිකත්වය, අව්‍යාජ බව වැනි ගුණාංග දැකිය හැක.
- පතුරු නැටුම සාමූහික නර්තන අංගයකි.
- පතුර එක් අතකට පමණක් ගෙන නර්තනය කිරීම ද විශේෂත්වයකි.
- ශබ්දය නිකුත් වන පරිදි සැකසූ පතුර ශරීරයේ විවිධ ස්ථානවලට තට්ටු කිරීමෙන් නැටීමේ දී නැගෙන හඬ චමත්කාරය.
- පතුර සකස් කිරීමේ දී කොස්, මහෝගනී, දවුල් කුරුඳු වැනි ශක්තිමත් දැව වර්ග භාවිත කරයි.
- අඟල් 15 – 18 පමණ දිගින් ද අඟල් 2ක් පමණ පළලින් ද අඟල් ½ පමණ ඝනකමින් ද යුක්තව පතුර සකස් කර ගැනේ.
- පතුරු නැටුමේ කවි ගායනා විවිධ නාද මාලාවලට විවිධ තාල රටා අනුව ගායනා කළ හැකිය.
- නිවැරදි නාදමාලාව අනුව ගායනය කිරීමෙන් එහි සංස්කෘතික වටිනාකම ආරක්ෂා වේ.






**තාල රූපය : මාත්‍රා 4 මහ තනි තිත**

| | |
|---|---|
| සූරිය කුල ඇති හිරු | දෙවියන්නේ |
| පෑවිය අණසක ලොව | පවතින්නේ |
| කාරිය කරවා පහදා | දෙන්නේ |
| පතුරු නැටීමට අවසර | දෙන්නේ |
| | |
| ලොව සෙත් කරවන පත්තිනි | සඳිනේ |
| සළුවක් අරගෙන සළු | සලමින්නේ |
| වෙනසක් නොසිතා මගෙ | ගුරුවරුනේ |
| පතුරත් අරගෙන රඟනෙමු | තොසිනේ |
| | |
| අතුරු නැතිව සබයේ | සිටිමින්නේ |
| මිතුරු ලෙසින් අපි පේළි | සෑදෙන්නේ |
| සතුරු වෙලා නොව දෙපිළ | බෙදෙන්නේ |
| පතුරු නටන්නට අවසර | දෙන්නේ |

